# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII | YEAR OF OUR LORD JESUS CHRIST, 2024 OCTOBER | Issue No. 11


## ශුද්ධවූ බයිබලය

### (හිතෝපදේශ 13:1-10)

01. ඥානවන්ත පුත්‍රයා තම පියාගේ ඔවා බස් අසන්නේය; එහෙත් නින්දාකරන්නා තරවටුව නොඅසන්නේය.

02. මනුෂ්‍යයෙක් තමාගේ මුඛයේ ඵලයෙන් යසස භුක්තිවිඳියි; එහෙත් ද්‍රෝහීන්ගේ ප්‍රාණය බලාත්කාරය විඳියි.

03. කට රැකගන්නා තමාගේ ජීවිතයද රැකවල්කරගනියි; එහෙත් බොහෝසෙයින් කට අරින්නා විනාශයට පැමිණෙයි.

04. අලසයාගේ ප්‍රාණය ආශාවන නුමුත් ඔහුට කිසිවක් නැත; එහෙත් කඩිසරයන්ගේ ප්‍රාණය තරවෙයි.

05. ධර්මිෂ්ඨයා බොරු කීමට ද්වේෂකෙරේ; එහෙත් දුෂ්ටයා පිළිකුලක්ව ලජ්ජාවට පත්වෙයි.

06. ධර්මිෂ්ඨකම සෘජු හැසිරීම ඇත්තා රැකවල්කරයි; එහෙත් දුෂ්ටකම පාපිෂ්ඨයා පෙරළා දමයි.

07. කිසිත් නැති නුමුත් වස්තුකාරයන් මෙන් පෙන්වන්නෝ සිටිති; බොහෝ සම්පත් ඇති නුමුත් දිළිඳුන් මෙන් පෙන්වන්නෝද සිටිති.

08. මනුෂ්‍යයෙකුගේ වස්තුව ඔහුගේ ජීවිතයේ මිදීමේ මිලයක් වන්නේය; එහෙත් දිළින්දාට තර්ජනයෙන් කමක් නැත.

09. ධර්මිෂ්ඨයන්ගේ එළිය ප්‍රීතියෙන් බැබළෙයි; එහෙත් දුෂ්ටයන්ගේ පහන නිවීයයි.

10. උඩඟුකමෙන් තරඟය අටගන්නවා පමණක්ය; එහෙත් දැනමුතුකම පිළිගන්නන් වෙත ප්‍රඥාව තිබේ.

## අපගේ සිතුවිලි වැදගත් වේ !

### (ඩේවිඩ්ගේ පරිවර්තනයක්)

### Our Thoughts Matter : Reflections FROM DAVID!



(ප්‍රධාන කර්තෘ දේවගැති ඇන්ඩලින් සෙල්වකුමාරි)

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තුලින් අපගේ සහෝදර සහෝදරියන් සමග මුණ ගැසීමට ලැබීම ගැන මා ඉතාම සතුටු වෙමි. අප සියලු දෙනාම දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ට කිරීමට අපගේ ජීවිතය උන්වහන්සේට කැප කරමින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීම අපගේ ජීවිතයට ලබාගත යුතුය.

එක්සත් ජනපදයේ පියෙක් ලෙස හඳුන්වන්නවූ බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් දිනක් මෙවැනි කියමනක් පැවසුවේය. එනම්, ''ඔබ පරාජය ගැන සැලසුම් කරනවා නම්, සැබැවින්ම ඔබට පරාජය අත්වෙනු ඇත'' යනුවෙනි. සැබැවින්ම අපගේ ජීවිතයේද මෙම සත්‍යතාවය අපට තේරුම් ගැනීමට පුළුවනි.

සමහර පුද්ගලයින් සැලසුම් කරන නමුත් ඔවුන්ට සාර්ථකවීමට අසීරුය.

තවත් සමහරු ඉතා හොඳ සැලසුම් දමන නමුත් ඒවා ඉෂ්ඨකර ගැනීමේදී බොහෝ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙයි.
තවත් සමහරු කිසිවක් සැලසුම් දමන නමුත් ඒවා ඉෂ්ඨකර ගැනීමේදී බොහෝ ප්‍රශ්ණ වලට මුහුණ දීමට සිදුවෙයි.

3 වෙනි පිටුවට ...


Echo of His Call



Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.


Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

# from your dearly beloved brother...





"ස්වාමීන්වහන්සේ නුඹලා උදෙසා සටන් කරනසේක. නුඹලා නිශ්ශබ්දව සිටිය යුතුයි...." (නික්මයාම 14:14)

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

ප්‍රිය මිත්‍රවරුනි, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට සුභ පතමි ! මේ කාලයේ අප පාස්ටර් සැම් සෙල්ව රාජ්ගේ ජීවිත කථා පොත රචනා කරමින් යන අතර දැන් එම පොත නිමාකරන තැනට පැමිණ සිටිමු. පසුගිය වසර 55 තුලදී කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළින් ඔබ ආශිර්වාදය ලබා තිබෙනවා නම්, පාස්ටර් සැම් සෙල්ව රාජ්ගේ ජීවිතය තුළින් ඔබගේ ජීවිතයට දෙවියන්වහන්සේ කිසියම් ගණුදෙනුවක් කර තිබෙනවා නම් ඔබගේ ජීවිතයට යම් බලපෑමක් සිදු වූයේ නම් එම අත්දැකීම් අපට ලියා එවන්න කියා කරුණාවෙන් ඉල්ලමු. අප ඔබගේ එම අත්දැකීම් මෙම පොතට ඇතුලත් කිරීමට බලාපොරොත්තු වෙමු.

2024 වන වර්ෂයේ අවසාන භාගයට අප ලංවී සිටින මේ මොහොතේදී අප ඔබ හා සමඟ අත්වැල් බැඳගෙන දෙවියන්වහන්සේගේ මහත් වූ මඟපෙන්වීමත් උන්වහන්සේගේ අනර්ඝ වූ ක්‍රියාවන් හා උපකාරයන් ගැන අප මුහුණදෙනු ලැබුවාවූ විවිධ ප්‍රශ්නකාරී අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ අපට කලාවූ සියලු උපකාරයන් නිසාත් අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු. මේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදත් වෙනස් නොවී සිටින නිසා ඔබගේ සියලු ප්‍රශ්න හා කරදර වලට උන්වහන්සේ පිළිතුරු දෙන සේක.

මෙම සඟරාව තුළින් අප ඔබගෙන් ඉල්ලන්නේ පහත කරුනු උදෙසා නොකඩවාම යාච්ඤා කරන ලෙසයි.

දල වශයෙන් බැලුවහොත් සැම මාසයකදීම භාෂා 16 කින් යුත් කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව නිකුත් කිරීම සඳහා පුද්ගලයින් 75 දෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායමක් ඉතා කඩිසරව ක්‍රියා කරමින් සිටී. ඔවුන්ගේ වගකීම් වනුයේ පණිවිඩය සූදානම් කිරීම, ටයිප් කිරීම, පරිවර්ථනය කිරීම, සඟරාව සම්පූර්ණයෙන්ම සකස් කිරීම, මුද්‍රණය කිරීම ආදී සියලු කාරණාවන් වෙයි. නියමිත කාලයේදී තැපැල් කාර්යාලයට ගොස් මේවා තැපැල් කිරීම හා විද්‍යුත් තැපැල් යැවීම ආදී එම සභාවේ සහෝදර සහෝදරියන් ඉතා කර්යක්ෂවම ඉටු කරති. මෙම 75 දෙනාගේ පවුල් උදෙසාත් ඔවුන්ගේ සුවය උදෙසාත් ඔවුන් මුහුණ දෙනු ලබන ප්‍රශ්න උදෙසාත් නිරන්තරයෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

පරිපාලන කටයුතු වලට අපට නිතරම විශාල ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වී තිබේ. රජය තුළ තිබෙන ප්‍රතිපත්ති වලට අනුකූලව සියලුම දේ අපට ඉටු කිරීමට සිදුව ඇත. අපට මුදල්මය අතින් උපකාර කරන්නාවූ සහෝදර සහෝදරයින් හා මිත්‍රයින් නිසා යාච්ඤා කරන්න. තවද අද බොහෝ දෙනෙක් ඔවුන්ගේ ආත්මික සටනේදී වැරදි ඉගෙනීම් හා වැරදි උපදෙස් පසුපස ගමන් කරමින් සිටී. නමුත් අපගේ දෙවියන්වහන්සේ අද වනතුරු සත්‍යයේ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේ විශ්වාසවන්තව සිටී. එබැවින් මේ සේවය උදෙසා යාච්ඤා කරන්න.

අපගේ ප්‍රධාන සභාව, නෙහෙමියා බයිබල් විදුහල, තැපැල් මාර්ගික පාඩම් මාලාව, YouTube සේවය, ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල, මුද්‍රණාලය යන මේ සියලුම සේවාවන් ඉතා ක්‍රමානුකූලව ඉදිරියට පවත්වාගෙන යන පිණිස අපට තිබෙන ආත්මික හා ආර්ථික ප්‍රශ්න වලින් මිදෙන්න අවශ්‍ය උපකාර නිසා යාච්ඤා කරන්න.

අපගේ ධර්මදූත සේවය සඳහා පිට පලාත් වලටත් සභාවන් වලටත් ගොස් සේවය කිරීමට අවශ්‍ය තවත් අය ලැබෙන පිණිසත් අපගේ මුද්‍රණාලය, කාර්යයාලය, පාසල හා බයිබල් විදුහලෙහි සේවය කිරීමට අවශ්‍ය තවත් අය ලබා දෙන්නය කියා යාච්ඤා කරන්න.

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**HON. MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

**ADMINISTRATION**
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**
Echo of His Call


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ YouTube Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

නෙහෙමියා බයිබල් විදුහලෙහි ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් බයිබලය ඉගෙන ගැනීමට අවශ්‍ය ශිෂ්‍ය, ශිෂ්‍යාවන් සොයා ගැනීම අපට මහත් අභියෝගයක් වී ඇත. බොහෝ නායකයින් ඔවුන්ගේ සභාවල සිටින තරුණයින්ව බයිබල් විදුහලට පැමිණ ඉගෙනගන්නවාට කැමති නැත. නුමුත් අප ඉතා ඕනෑකමින් ඔවුන්ගේ අධ්‍යාපනය, පුහුණුව, කෑම බීම ආදී ඔවුන්ට අවශ්‍ය සියලුම අවශ්‍යතා ගැන සොයා බලමු. මේ සේවය තුළින් අප ඔවුන්ට ඉතා හොඳින් පුරුදු පුහුණු කරනම් වෙනත් පළාත් වලට සේවය සඳහා යන පිණිස යොමු කරමු. මේ සේවය සඳහා අප ඔවුන්ගෙන් කිසිදු මුදලක් අය නොකරමු. මේ අය පිට පළාත් වලට ගොස් ඉතා අනර්ඝවූ සේවයන් ඉටු කරයි. කරුණාකර මෙම තත්වය උදෙසා යාච්ඤා කරන්න.

සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා නොවැම්බර් යන මාසයන් හිදී අප බොහෝ එළිමහන් ශුභාරංචි රැස්වීම් පැවැත්වීමට සූදානම් වෙමින් ඔබගේ යාච්ඤාවේදී අපට අවශ්‍ය මේ සේවාවන් ගමන යාමට ඔබට උදවු හා උපකාරයන් අවශ්‍ය වෙයි. ඔබ අප වෙතට එවන්නාවූ මුදල් ඇනවුම්, චෙක්පත්, අන්තර්ජාලයේ මුදල් මාරු කිරීම් යන මේ සියල්ලම අපි ඔබට ලදු පතක් නිකුත් කර එය ඔබට ලැබීමට සලස්වමු. එය ඔබට ලැබුනේ නැතිනම් කරුණාකර එය අපට දන්වන්න. පහත ඇති දුරකථන අංක වලට අපට කථා කිරීමට පසු බට නොවන්න. +91 98410 71858 හෝ +91 98412 71858. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ කෙරෙහි වේවා !.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858,
E.mail : sam@echoofhiscall.org

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

තවත් සමහරු කිසිවක් සැලසුම් කරන්නේ නැත. නමුත් ඔවුන් ගමන් කරන්නාවූ ආකාරයෙන්ම යාමට ඔවුන්ගේ ජීවිතයට ඉඩ දෙයි.

මේ අතරින් ඔබ කුමණ කොටසට අයිතිදැයි කියා මා නොදනිමි. දේව වචනයෙහි හිතෝපදේශ 19:21හි මෙසේ පවසයි. ***''මනුෂයෙකුගේ සිතේ බොහෝ යෝජනා ඇත්තේය. එහෙත් ස්ථිර වන්නේ ස්වාමින්වහන්සේගේ මන්ත්‍රණයයි''***

අපගේ අනාතගතය ගැන අපට බොහෝ සැලසුම් දැනීමට පුළුවනි. එනම් අධ්‍යාපනය, විවාහය, දරුවන්, රැකියාව, වස්තු රැස්කිරීම ආදියයි. මෙවැනි දේ ගැන අපට බොහෝ සැලසුම් දැමීමට පුළුවනි. නමුත් අප කොපමණ උත්සාහ කලත් සැලසුම් දමනු ලැබූවත් අවසානයේදී එය ඉෂ්ඨ කරනු ලබන්නේ දෙවියන්වහන්සේයි. ***හිතෝපදේශ 16:9*** හි මෙසේ පසවසයි. ***''මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමු කරවයි, එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමීන්වහන්සේය.''*** එනම්, අපගේ සැලසුම් කෙසේ වෙතත් අපගේ මාර්ග ස්ථිර කරන්නේ ස්වාමීන්වහන්සේයි.

විශේෂඥයින් පවා පවසන්නේ, අපගේ ක්‍රියාවන් හා අපගේ හැඟීම් පාලනය කරනු ලබන්නේ අපගේ සිතුවිලි බවයි. එනිසා දේව වචනය මෙසේ පවසයි. එනම්, 'ඔබගේ මනස රැකගන්න' යනුවෙනි. අපගේ මනසට අප ඇතුලුකරගන්නාවූ සිතුවිල්ල තුළින් ඇතිවන ප්‍රතිඵලය වන්නේ, අපගේ කථාව හා අපගේ හැසිරීම තුල ඇතිවන වෙනස්කම්ය.

අපගේ මුළු ජීවිතයම වෙනස් කිරීමට එක් සිතුවිල්ලකට හැකියාව තිබේ. දෙවියන්වහන්සේ අපගේ සිතුවිලි ගැන සිතන්නේ මොනවාද කියා බලමු. ***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි....'' (යෙරමියා 29:11)*** උන්වහන්සේ අප ගැන සිතන්නාවූ සිතුවිල්ල අපගේ යහපතට කියා සිතමින් උන්වහන්සේ ක්‍රියා කරයි. මේ ලෝකය මැවූවාවූ දෙවියන්වහන්සේ තමා ගැන ඉතා උනන්දුවෙන් සිතා බලනවා දැයි කියා සිතන්නට පුළුවන්ද? උන්වහන්සේ මගේ අනාගතය ගැන පමණක් නොව මාගේ පරම්පරාවේ අනාගතය ගැන් සිතා හමාරයි. එනම්, දෙවියන්වහන්සේ අප ගැන සලකන බැවින්ද අප ගැන සිතන බැවින්ද අපට යහපත් වූ දේ කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බවයි.

දේව වචනය මෙසේ පවසයි. ***''මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේයයි ස්වාමීන්වහන්සේ කියනසේක.'' (යෙසායා 55:8)*** අප සිතනවාටත් අප බලනවාටත් වඩා අප ගැන උන්වහන්සේ සිතයි. අප ගැන සොයා බලයි.

උදාහරණයක් ලෙස විනිශ්චයකාරයානන්ගේ පොතේ 6 වන පරිච්ඡේදයෙහි ගිඩියොන් ගැන සඳහන් කර ඇති දේ බලන්න. ඔහු මිදියන්වරුන්ට හයවූ නිසා ඔවුන්ගෙන් තිරිඟු සඟවාගන්න පිණිස ඒවා මුද්‍රික යන්ත්‍රයෙහි මඩිමින් සිටියේය. ඔහුට ආත්මික ශක්තියක් හා බලයක් නොතිබුණ නිසා ඔහු මෙය ප්‍රසිද්ධියේ නොකර හොරෙන් කරනු ලැබුවේය.

ගිඩියොන්ගේ ස්වභාවය වූයේ මෙයයි. නමුදු දෙවියන්වහන්සේට ඔහුට හමුවූ විට ඔහු සම්බන්ධව දෙවියන්වහන්සේ ප්‍රකාශ කරනු ලැබූයේ කෙසේද?

*''ස්වාමීන්වහන්සේ දූතයා ඇවිත් අබියෙශ්‍රීය යෝවාෂ්ට අයිති වූ ඔප්‍රාහි තිබෙන ආලෝන ගස යට හිඳගත්තේය. යෝවාෂ්ගේ පුත්‍රවූ ගිඩියොන් මිදියන්වරුන්ගෙන් තිරිඟු සඟවාගන්න පිණිස ඒවා මුද්‍රික යන්ත්‍රයෙහි මඩිමින් සිටියේය. ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට පෙනී, ධෛර්‍යමත් බලවත් මනුෂ්‍යය, ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටින සේක.'' (විනිශ්චයකාරයන්ගේ පොත 6:11 - 12)*



**The Angel appeared to Gideon**

දෙවියන්වහන්සේ ගිඩියොන්ට ධෛර්‍යමත් බලවත් මනුෂ්‍යය කියා පවසන විටදී ගිඩියොන් ඔහු ගැන පැවසුවේ වෙනස් වූ ආකාර කථාවකි.

ඔහු කථාකරමින්, ***''අහෝ, ස්වාමිනි, කුමකින් මම ඉශ්‍රායෙල් ගළවාගනිම්ද? බැලුව මැනව, මාගේ පවුල මනස්සේහි ඉතා දිළිඳු පවුලය. මමද මාගේ පියාගේ ගෙයි ඉතාම කුඩා තැනැත්තා වෙමි.'' (විනිශ්චයකාරයන්ගේ පොත 6:15)***

ගිඩියොන් ඔහු ගැන සිතුවේ ඔහු ඉතා දුර්වල පහත් වූ කෙනෙක් ලෙසයි. නමුත් දෙවියන්වහන්සේ ඔහු ගැන සිතුවේ ධෛර්‍යමත් බලවත් වූ පුද්ගලයෙක් ලෙසටයි. නමුත් දෙවියන්වහන්සේ ගිඩියොන් දෙස බලනු ලැබූයේ ඉශ්‍රායෙල් සෙනඟව මිදියන්වරුන් අතින් ගළවාගන්නාවූ නායකයා ලෙසයි.

බොහෝ විට අපි අප ගැනම සිතන්නාවූ හීනමාන තත්වයත් සිතුවිල්ලත් නිසා එය අපට ඉදිරියට යාමට බාධාවක් වී තිබේ. දෙවියන්වහන්සේගේ කැඳවීමත් අප තුල තිබෙන්නාවූ තලෙන්තත් මොනවාද කියා අප තේරුම්ගත යුතුයි. එසේ නොවුනහොත් දෙවියන්වහන්සේ අප තුල තබා තිබෙන්නාවූ දිව්‍යමය සැලැස්ම අපට ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත.

## ඉදිරිය ගැන සිතීම !

සමහර පුද්ගලයින් දෙවියන්වහන්සේ කෙරෙහි බලා නොසිට තමුන්ගේම කැමැත්ත හා සැලැස්ම ඉෂ්ඨකර ගැනීමට ගොස් වැටී යති. මෝසෙස් ගැන බලන්න. හෙබ්‍රෙව්වෙක් හා මිසරයෙක් ගහගනිමින් සිටින විට මෝසෙස් තම සෙනඟ ඔහුට නිදහස් කරගැනීමට පුළුවන් කියා සිතමින් ක්‍රියා කලේය. නමුත් මෙය දේව සැලැස්ම වූයේ නැත. නැවත මෝසෙස් හෙබ්‍රෙව්වන් දෙදෙනෙක් ගහගනිමින් සිට විටදී එම රණ්ඩුවට මැදිහත් වූ නිසා ඇති වූ කථා බහ හේතුවෙන් ඔහුට පලායාමට සිදු විය. මන්ද ඔහු දෙවියන්වහන්සේගේ වේලාව පැමිණෙන තුරු බලා සිටීමට නොහැකි විය.

## සිතුවිල්ලේ බලවන්තකම !

අපගේ සිතුවිලි ඉතාම බලවත් විය යුතුය. මන්ද අපගේ හැසිරීමටත් අපගේ හැඟීම් වලටත් අපගේ කථාවටත් බලපානු ලබන්නේ එම සිතුවිල්ලම වෙයි. අපගේ මනස ආරක්ෂා කරගන්නය කියා දෙවියන්වහන්සේගේ වචනයෙහි සඳහන් කර තිබේ.මන්ද අනවශ්‍ය වූ සිතුවිලි අපගේ මනස තුලට ගොස් අපගේ ජීවිතය විනාශ කිරීමට පුළුවනි. අපගේ මනසට කුමනාකාර සිතුවිලි ඇතුලුවන්නේද එය අපව දෙවියන්වහන්සේගේ සැලසුම වෙතට ඇඳගෙන ගොස් අපගේ ජීවිතය සාර්ථකත්වය පත්කරයි.

## දාවිත්ගේ ඇතුලාන්තය !

දාවිත් ඔහුගේ ජීවිත කාලය තුලදී දෙවියන්වහන්සේව සොයමින් උන්වහන්සේව සැමවිටම සතුටු කිරීමට උත්සාහ දැරුවේය. සාවුල් නිතරම දාවිත්ව විනාශ කිරීමට උත්සාහ දැරුව මුත් දෙවියන්වහන්සේ සාවුල් අතට වැටීමට ඔහුට ඉඩ දුන්නේ නැත. අවස්ථාවන් 3 කදීම මේ ආකාරයට සිදු විය. දාවිත්ට සාවුල්ව මැරීමට අවස්ථාවන් පැමිණුනත් ඔහු 'දෙවියන්වහන්සේගේ ආලේප ලත් තැනැත්තාට අත තැබුවේ නැත' සාවුල් මේ ආකාරයට ක්‍රියා නොකලත් දාවිත් නිවැරදි ආකාරයට ක්‍රියා කලේය.

සාවුල්, එක් අවස්ථාවකදී දාවිත් කෙයිලාට ගිය විටදී ඔහුට එම ස්ථානයෙන් පැනයාමට බැරිය කියා සිතුවා, (1 සාමුවෙල් 23 පරි.) එහෙත් මෙහිදී දෙවියන්වහන්සේ දාවිත්ව බේරාගත් ආකාරය අපි දකිමු. නැවත 26 වන පරිච්ඡේද තුළ දාවිත්ව අල්ලා ගැනීමට සාවුල්ට හැකියාව තිබූ නමුත් එහිදීද දෙවියන්වහන්සේ දාවිත්ව බේරා ගත්තා.

එම 26 වන පරිච්ඡේදයෙහිම දාවිත්ට සාවුල්ව මැරීමට අවස්ථාවක් පැමිණුනත් ඔහු එලෙස නොකර

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ඔක්:19-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය බාධා මධ්‍යයේ වුවද දෙවියන්වහන්සේගේ ගොඩනැගීමට ක්‍රියා කරන නිසා ස්තුති කරන්න.

**ඔක්:20-** ශාන් පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පති, කාර්‍යය මණ්ඩලය සහ සිසුන් නිසා ස්තුති කරන්න

**ඔක්:21-** කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවට සහාය දැක්වීමට කැපවූ සහකාර සංස්කාරවරුන් අපගේ සේවයට ආශිර්වාදයක් වූ නිසා ස්තුති කරන්න.

**ඔක්:22-** අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලට නව විදුහල්පතිවරයෙක් පත් කිරීමට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබෙන්න කියා ස්තුති කරන්න.

**ඔක්:23-** අපගේ මුද්‍රණාලයෙන් භාෂා 16 කින් යුතු සඟරාව මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට සහ එය අවශ්‍ය ස්ථාන කරා බෙදා හැරීමට අපට හැකියාව ලබා දීම නිසා ස්තුති කරන්න.

**ඔක්:24-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්‍යය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කරන නිසා ස්තුති කරන්න.

**ඔක්:25-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා විනාඩි 5 කින් විකාශනය වන පණිවිඩ තුළින් ආශිර්වාද ලැබූ බවට දරන සාක්ෂි නිසා ස්තුති කරමු.

**ඔක්:26-** අපගේ සේවයට කැපවූ සේවකයින්ගේ සහය ඇතිව අපගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම නිසා ස්තුති කරන්න.

**ඔක්:27-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, අපට උපකාර කරන හවුල්කරුවන්, විශ්වාස හවුල්කරුවන් ජීවිත කාලය සඳහාම හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් අප කෙරෙහි දක්වන්නාවූ සහාය නිසා ස්තුති කරමු.

**ඔක්:28-** අපගේ විවිධ සේවාවන් වලට අඛණ්ඩවම උන්වහන්සේ මඟපෙන්වන නිසා ස්තුති කරමු.

**ඔක්:29-** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාවේ සහ දේව ධර්ම පාඨාමාවේ වර්ධනය සැමරීම නිසා ස්තුති කරමු.

**ඔක්:30-** නෙහෙමියා බයිබල් විදුහල ඉතා හොඳින් පවත්වාගෙන යාමට දෙවියන්වහන්සේ දක්වන්නාවූ කරුණාව නිසා ස්තුති කරමු.

**ඔක්:31-** අපගේ මිෂනාරිවරුන් සහ ඔවුන්ගේ පවුල් වලට ලබා දුන් ආශිර්වාද නිසා ස්තුති කරමු.

**නොවැ:01-** විවිධ සේවාවන් හරහා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමා දැක්වූ කැපවීම නිසා ස්තුති කරමු.

**නොවැ:02-** අපගේ ප්‍රධාන සභාවේ පුරුෂ රැස්වීම දෙවියන්වහන්සේට දුන් ආශිර්වාද නිසා ස්තුති කරමු.

**නොවැ:03-** පසුගිය මාසයේදී අපගේ සියලු මූල්‍යමය අවශ්‍යතා සහ ආත්මික අවශ්‍යතා සැපයූ නිසා ස්තුති කරමු.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**නොවැ:04-** ලොව පුරා සිටින්නාවූ දේවගැතිවරුන් සහ මිෂනාරිවරුන් දිව්‍යමය ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:05-** යුද්ධයේ අවසානය සහ යුක්රේනයේ සහ රුසියාව අතර සමගිය හා සමාදානය යලි ස්ථාපිත කරන්න කියා යාච්ඤා කරන්න.

**නොවැ:06-** සියලුම කිතුණු සංවිධාන සහ දේවස්ථාන වලට ආශිර්වාදය හා ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:07-** සියලුම ඇදහිලිවන්තයින්ගේ හදවත්වලට ප්‍රඥාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:08-** අපගේ සහෝදරී ජෙඩී වීනා සැම් සෙල්ව රාජ් නැවත රෝගීව සිටින බැවින් යාච්ඤා කරන්න.

**නොවැ:09-** ලොව වටා සිටින්නාවූ සියලුම ආත්මික නායකයින් උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:10-** අපගේ ප්‍රධාන පාලකතුමාගේ ජීවිත කථාව ඇතුලත් පොත ලිවීමට අවශ්‍ය ඔහුගේ ත්‍යාගශීලි මඟපෙන්වීම උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:11-** අපගේ මිෂනාරී සේවයේ යෙදී සිටින්නාවූ සේවකයින් උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:12-** අපගේ කැඳවීමක් ඇති සේවකයින් ගෙනෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:13-** අපගේ මූල්‍යමය අවශ්‍යතා, සේවකයින් සඳහා ලබා දෙන්නාවූ වේතන, මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍යතා ඇතුළු මූල්‍ය අවශ්‍යතා උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:14-** මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් සහ වැරදි දහගත තත්ව වලට ඇබ්බැහි වූවන්ට නිදහස ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:15-** මෙම පරම්පරාවේ තරුණයන් සහ දරුවන් වෙනුවෙන් යාච්ඤා කිරීමේ සේවයට තවත් අය එකතු වෙන්නට කියා යාච්ඤා කරන්න.

**නොවැ:16-** සියමලු ආගම් අතර සමගිය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:17-** ළඟා නොවූ ප්‍රදේශ වල ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට අපට හැකියාව ලඅබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:18 -** අපගේ නායකයින්, රාජ්‍ය නිළධාරීන් සහ බලයලත් අය කෙරෙහි දෙවියන්වහන්සේගේ කරුණාව හා දයාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

දෙවියන්වහන්සේගේ ආලේපලත් දාසයාට විරුද්ධව මා යන්නේ නැත කියා එතැනින් පලා ගියේය. මේ සෑම පරීක්ෂාවක් තුළින්ම දෙවියන්වහන්සේ දාවිත්ගේ ජීවිතයට විශ්වාසවන්තව සිටියේය. සාවුල් දාවිත්ව මැරීමට කොපමණ උත්සාහ කරනු ලැබූවත් දෙවියන්වහන්සේ දිගටම දාවිත්ව ආරක්ෂා කරනු ලැබුවා. *''...සාවුල් හැමදාම ඔහු සෙවුවේය. නමුත් දෙවියන්වහන්සේ සාවුල් අතට ඔහු පාවා නුදුන්සේක.'' (1 සාමුවෙල් 23:14)*

මේ සියල්ල කෙසේ වෙතත් දාවිත්ගේ ජීවිතයට මෙන් අපගේ ජීවිත වලටද ප්‍රශ්න ඇති වෙයි. අප දෙවියන්වහන්සේට ප්‍රේමකරනවා උන්වහන්සේට ප්‍රේම කරනවා දෙවියන්වහන්සේ අප ගැන දන්නවා කියාත් අප සිතනවාට වඩා දෙවියන්වහන්සේ අපගේ ජීවිත තුල විශාල දේ කිරීමට හැකිය කියාත් සිතනවා. නමුත් සැකය කියන බීජය අප තුලට ඇතුලුවීම කරණකොට ගෙන අප ඉතා දුර්වල වූ තීරණ ගනිමු.

1 සාමුවෙල් 27 වන පරිච්ඡේදයෙහි දාවිත්ගේ ජීවිතයෙහි ඉතාම දුර්වල වූ අවස්ථාවක් ගැන අපට පෙනෙයි.

27 වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ 'දාවිත් තමාගේ සිතින් කල්පනා කරමින්' කියාය. එනම්, එම සිතුවිල්ල කරණකොටගෙන සාවුල් අතින් තමාට මරණය පැමිණෙයි කියා ඔහුට භයක් ඇති විය. එම නිසා දාවිත් ඔහුගේ ආරක්ෂාව නිසා ඔහු සමඟ සිටි මනුෂ්‍යයන් භයසියය සමඟ පිලිස්තිවරුන්ගේ දේශයට ගොස් රැකවරණය ලබා ගැනීමට සිතුවේය. ස්වාමීන්වහන්සේගේ හස්තයට වඩා සතුරා ළඟට ගියොත් තමාට සුරක්ෂිත බව ලැබෙයි කියා ඔහු සිතුවේය.

මේ කාලය තුලදී දාවිත්ට ලෝකාකාර ලෙස ආශිර්වාදයන් ලැබුණි. ඔහු ගිය ගිය සෑම ස්ථානයකදීම ඔහු ජයග්‍රහණය ලබා ගත්තේය. ඔහුට බලය, වස්තුව, ආධිපත්‍ය හා ජනප්‍රියකම ලබා ගත්තේය.

අපට ලැබෙන්නාවූ සෑම ආශිර්වාදයක්ම දෙවියන්වහන්සේගේ දිව්‍යමය ආශිර්වාදයන්ය කියා අප බොහෝ විට සිතමු. අපව පොහොසත් කිරීමටත් ජනප්‍රියත්වයට පත් කිරීමටත් හා අපව දියුණු කිරීමටත් යක්ෂයාට හැකියාව තිබේ. මෙවැනි ආශිර්වාදයන් අපට ලැබෙන්නේ දෙවියන්වහන්සේගෙන්ද? නැතිනම් යක්ෂයාගෙන්ද? කියා අප නිතරම සොයා බැලිය යුතුයි. අපට ලැබෙන්නාවූ ආශිර්වාදයන් අපව දෙවියන්වහන්සේගෙන් ඈත් කරනවා නම්, දෙවියන්වහන්සේගේ සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවයන් අපව දුර්වල කරනවා නම් අපව සෝදිසි කර බැලීමට කාලය පැමිණ තිබෙයි. අප භුක්ති විඳින්නාවූ ආශිර්වාදයන් සැබවින්ම දෙවියන්හන්සේගෙන්ම ලැබුනාවූ ආශිර්වාදයන්ද කියා සොයා බැලිය යුතුයි.

දාවිත් සෑමදේම භුක්ති විඳිමින් සතුටු විය.. ඔහු කලාවූ සෑම ක්‍රියාවක්ම දෙවියන්වහන්සේ විසින් අනුමත කලාය කියා ඔහු සිතුවේය. මේ කාලය තුලදී දාවිත් කිසිම ගීතිකාවක් රචනා කලේ නැත. ඔහු සෑම විටම සතුරාව මැරීමට හා සතුරාගෙන් ජය ගැනීමට උත්සාහ කලා. දේව වචනයෙහි මෙසේ පවසයි. *''දාවිත් පුරුෂයෙක්වත් ස්ත්‍රීයෙක්වත් ඉතුරු නොකර දේශයේ සියල්ලන් මරා දමා, බැටළුවන්ද ගවයින්ද කොටළුවන්ද, ඔටුවන්ද වස්ත්‍රද අරගෙන හැරී ආකීෂ් ළඟට ආවේය.'' (1 සාමුවෙල් 27:9)*

දාවිත් ඔහු කල සියලුම ක්‍රියාවන් හරි කියා සිතුවේය. ඔහු කුරිරු මිනීමරුවෙක් ලෙස වෙනස් විය. ඔහු පිලිස්තිවරුන් සමඟ සිටි විටදී මෙවැනි මෙවැනි සියලු ක්‍රියාවන් කරමින් දේව අභිමුඛත්වයෙන් තොරව දේව සැලැස්මෙන් තොරව ක්‍රියා කරනු ලැබුවේය.

1 සාමුවෙල් 28 වන පරිච්ඡේදය දෙස බලන විටදී අපට පෙනී යන්නාවූ කාරණය නම් දාතවී ඉශ්‍රායෙල්ට විරුද්ධවත් සාවුල්ට විරුද්ධවත් යුද්ධයට ගිය බවයි. නමුත් පිලිස්තිවරු දාවිත්ට යුද්ධයට එන්න එපාය කියාත් ඔහු සිටින්නාවූ ස්ථානයෙහිම සිටින්නය කියාත් ඔහුව නැවැත්තුවේය.

යමෙක් දෙවියන්වහන්සේ වෙතින් පසු බට වෙනවා නම්, ඔහු පියවරෙන් පියවර පස්සට යයි.

දාවිත් මෙම යුද්ධයට ගොස් නැවත පැමිණෙන විටදී ඔහු හම්බුකල සියල්ලම සතුරා ගෙන ගොස් තිබුන බව ඔහු දුටුවේය.

*1 සාමුවෙල් 30:1 - 2 ''තවද දාවිත් හා ඔහුගේ මිනිස්සු තුන්වෙනිදා ශික්ලග්ට පැමිණුනෝය. ඊට ප්‍රථම අමලෙක්වරු දකුණු*

*දිශාවටත් ශික්ලග්ටත් විරුද්ධව ඇවිත්, ශික්ලග්ට පහර දී එක ගින්නෙන් පුලුස්සා දමා, එහි සිටි ස්ත්‍රීන්ද ලොකු කුඩා සියල්ලන්ද වාලට ගෙන, කිසිවෙකු නොමරා ඔවුන් අල්ලාගෙන යන්ට ගියෝය.''* සියලුම දේ අහිමි විය. ඔහුගේ විශ්වාසව සිටි මනුෂ්‍යයන්ගේ භාර්‍යාවන්ද ඔහුගේ සියලුම දෑද සතුරා විසින් ගෙනගොස් තිබුණි.

*1 සාමුවෙල් 30:6* හි මෙසේ පවසයි. *''දාවිත් තද අමාරුවට පත්විය. මක්නිසාද මුළු සෙනඟගේ සිත් තම තමුන්ගේ පුත්‍රයන්ද දූවරුන්ද ගැන ශෝකවූන බැවින් ඔහුට ගල් ගසන්ට සෙනඟ කතා කලෝය....''*

දාවිත් තනිවිය. සෑම කෙනෙක්ම ඔහුට විරුද්ධව නැඟී සිටියෝය. ඔහුගේ පවුල ඔහුට නැතිවිය. ඔහු ලබා ගත්තාවූ සියලුම දේ ඔහුට නැති විය. එක් රාත්‍රියක් තුලදී මේ සියලුම දේ ඔහුට අහිමි විය. ඔහු සමඟ එකට සිටි සෙනඟ ඔහුට විරුද්ධව නැගිට ඔහුව මරා දැමීමට උත්සාහ කලේය. කිසිවෙක් ඔහුව තේරුම් ගත්තේ නැත.

අපත් නායකයින් ලෙස මෙවැනිම වූ තනිකමේ අත්දැකීම් තුළින් ගමන් කිරීමට හැකිය. සැමදේම ඉතා හොඳින් සිදු වෙන විට ප්‍රශංසාව අපට ලැබෙන අතර යමක් වරදන විටදී කිසිවෙක් අප සමඟ සිටින්නේද නැත. දාවිත් මානසිකව මහත් පීඩනයකට පත් විය. ඔහු සිටි තත්වය ඔබට තේරුම්ගැනීමට හැකිද?

සමහර අවස්ථාවන් වලදී අප දෙවියන්වහන්සේගෙන් ඈත්වී සිටින විටදී අපට ලැබෙන්නා වූ සෑම ආශිර්වාදයක් තුළින්ම සියල්ල යහපත් ආකාරයෙන් සිදුවෙන්නේය කියා අපි සිතමු. නමුත් අප දේව කැමැත්තට පිටුපා සිටියත් දෙවියන්වහන්සේගේ මහත් වූ ප්‍රේමය නිසා උන්වහන්සේගේ සැලැස්මට අපව ඇතුලත්කරමින් උන්වහන්සේගේ මහත් වූ ප්‍රේමය නිසා අප කෙරෙහි බලා සිටී යේසුස් වහන්සේ ස්වර්ගයේ සියලු සැප සම්පත් අත් හැර දමමින් මේ ලෝකයට පැමිණුනේ මේ කාරණය නිසාය.

*''උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපකාරය දරන සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින්ම අල්ලාගෙනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා,*

*එය ඉවත්කර, දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණි සේක.*

*මනුෂ්‍යයකාරයෙන් සිටි කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක.'' (පිලිප්පි 2:6-8)*

අපගේ ජීවිතය අර්ථවත් කරන පිණිස උන්වහන්සේ කල්වාරි කුරුසියට ගොස් තම ජීවිතය පූජා කලේය. එතුලින් අපගේ ජීවිතයට අරමුණක් ලබා දුන්නේය. අපට ප්‍රතිලාභයක් දෙන පිණිස උන්වහන්සේ නැවත පැමිණෙයි. මේ සියලුම දේ තුළින් උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ, අප උන්වහන්සේට ප්‍රේම කරමින් උන්වහන්සේ සමඟ ඇවිදින්න ඕනි කියාය.

දාවිත් තමාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ තුළ ශක්තිය උපදවාගත්තේය.

දාවිත් තද අමාරුවට පත්වුනේය කියා දේව වචනයෙහි පවසයි. නමුත් නැවත දේව වචනය තුළ පවසන්නේ ඔහු දෙවියන්වහන්සේ තුළ තමාව ශක්තිමත් කරගත් බවයි. ඔහු දෙවියන්වහන්සේ වෙතින් ඈත්වූ බව තේරුම්ගත්තේය. තමාගේ සවිය

....Contd. to page 9


# RESIDENTIAL BIBLE COURSE
NEHEMIAH BIBLE COLLEGE, Chennai.

Medium : Hindi/Tamil

Pray for

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

Diploma in Theology

Rush for Admission!

Qualification : 10th Standard & above

Contact : The Chairman, Nehemiah Bible College.

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

* ONLINE CLASSES ARE AVAILABLE *



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." *(මතෙව් 24:15)*

## අනර්ඝයි එහෙත් සත්‍යයි!

***"....මනුෂ්‍යය තෙමේ පිටාතර පෙනීම බලන්නේය. නුමුත් ස්වාමීන්වහන්සේ සිත බලනසේක." (1 සාමුවෙල් 16:7)***

වරක් මාගේ පුතා වන ඇලෙක්ස් සැම්සන් සෑම් සහ මා හට විදෙස් රටකට දෙවියන්වහන්සේගේ සේවය උදෙසා උන්වහන්සේගේ වචනය බෙදා ගන්නා පිනිස ආරාධනාවක් ලැබුනි. අපට එහි ආරාධනා කලාවූ සහෝදරයා එහිදී වැයවන සියලුම වියදම් බලා ගන්නා බවද පැවසුවේය. පසුව අප එම දේශයට ගොස් දෙවියන්වහන්සේගේ සේවය ඉතා අනර්ඝ ලෙස ඉටු කලේය. දෙවියන්වහන්සේ ඉතා බලවත් ලෙස ක්‍රියා කලේය. බොහෝ ආත්ම දෙවියන්වහන්සේ වෙතට ගැලවීම ලැබුවේය.

මේ සියලුම සේවවාන් නිමා කර නැවත අප අපගේ දේශයට පැමිණෙන පිණිස පිටත් වුවෙමු. නමුත් අපට ආරාධනා කලාවූ සහෝදරයා අපගේ ගමන් වියදම් සියල්ලම බලගන්නා බවද පැවසුවේය. පසුව අප එම දේශයට ගොස් දෙවියන්වහන්සේගේ සේවය ඉතා අනර්ඝ ලෙස ඉටු කලේය. දෙවියන්වහන්සේ ඉතා බලවත් ලෙස ක්‍රියා කලේය. බොහෝ ආත්ම දෙවියන්වහන්සේ වෙතට ගැලවීම ලැබුවේය.

මේ සියලුම සේවාවන් නිම කර නැවත අප අපගේ දේශයට පැමිණෙන පිණිස පිටත්වුවෙමු. නමුත් අපට ආරාධනා කලාවූ සහෝදරයා අපගේ ගමන් වියදම් සියල්ලම අපට දෙන බවට පොරොන්දු වුවත් ඔහුට එය දීමට නොහැකි විය. මේ නිසා අපට මහත් අභියෝගයකට මුහුණ දීමට සිදු විය. නමුත් මේ තත්වය ගැන අප කිසිම විටෙක කලබලයට පත් වුයේ නැත. දේ වචනයෙහි පවසන්නාවූ ආකාරයට '*'තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව." (රෝම 8:28)* මෙම පදය තුලින් උන්වහන්සේගේ සැනසීම අපට ලැබුනේය.

ඊළඟ නගරයට යන පිණිස අප දෙදෙනා ගුවන් ටිකට් පත් මිලදී ගනු ලැබූවත් කෑම සඳහා වියදම් කිරීමට අපට අවශ්‍ය මුදල් තිබුනේ නැත. අප මිලදී ගත් ටිකට් පතට වතුර බෝතලයත් ලබා ගැනීමටද හැකියාක් තිබුනේ නැත. ඒනිසා අපට කුසගින්නෙන් හා පිපාසයෙන් යුතුව යාමට සිදු විය.

කෙසේ වෙතත් මා සහ මාගේ පුතා කිසි කෙනෙක් ගැන තිත්තකමක්වත් අපට ආරාධනා කලාවූ සහෝදරයාට දොස් පැවරීමක්වත් නොකර දෙවියන්වහන්සේ අපගේ සියලුම කරදර හා සියලුම අවශ්‍යතාවයන් බලා ගනියි කියා සිතමින් නිහඬව ගමන් කලා.

පසුව අප එම නුවරට ගිය විටදී දෙවියන්වහන්සේගේ දරුවන් අපව ඉතා සුහදශීලිව පිළිගත්තේය. අබට නැවතීමට ස්ථානයක් ලබා දී එහිදී අපව ඉතා හොඳින් බලා ගත්තේය.

පසු දිනදී අපව බැලීමට එක් සහෝදරයෙක් අප සිටි ස්ථානයට පැමිණ ටික වේලාවක් අප සමඟ කාලය ගත කළේය. පසුව ඔහු මා අතට කවරයක් දී ''මේක ඔබගේ හදිසි අවශ්‍යතාවයන්ට පාවිච්චි කරන්න ඔබට දෙන්න කියා දෙවියන්වහන්සේ මට පැවසුවා'' කියා පවසා යන්නට ගියේය. එම කවරය තුළ තිබූ මුදල් අපගේ ගමන් ගාස්තු වලට වඩා වැඩි මුදලක් තිබුණි. එය දුටු අප ඉවහත් ප්‍රීතියට පත්වුණෙමි. අපට කිසි අඩුවක් සිදුවුනේ නැත. සියල්ලම දෙවියන්වහන්සේ බලා ගත්තේය. මෙය ඉතා පුදුම හාස්කමකි.

සේවය කරන්න තෝරා ගන්නවාද? ප්‍රිය මිත්‍රය, ඔබත් මෙම දෙවියන්වහන්සේට සේවය කරන්න. ඔබට කිසිසේත් හිඟවන්නේ නැත. ''තරුණ සිංහයෝ හිඟ ඇතිව සාගින්න විඳිති. නමුත් ස්වාමීන් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් හිඟයක් නොවන්නේය. (ගීතාවලිය 34:10) ''ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන මනුෂ්‍යා ආශිර්වාදලද්දේය (ගීතාවලිය 34:8)

*************


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

*7 පිටුවෙන්....*

අලුත්කර ගැනීමට ඔහු දෙවියන්වහන්සේ වෙතට නැවත හැරුනේය. ඔහු වැටී සිටි අසරණ වූ තත්වයෙන් එසවීමට බලය ඇත්තේ යේසුස් වහන්සේට පමණක්ම බව ඔහු තේරුම් ගත්තේය. පීඩාවේදී ඔහුට තිබෙන්නාවූ එකම උපකාරත් ස්වාමීන්වහන්සේ පමණක්ම බව ඔහු දැනගත්තා. එම නිසා ඔහු දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ගොස් දැන් මා කළයුත්තේ මොනවාද කියා දෙවියන්වහන්සේ ගේත් ඇසුවා. මේ අවස්ථාවේදී දාවිත්ට අවශ්‍ය වූයේ දෙවියන්වහන්සේ සමඟ සිටිමින් උන්වහන්සේගෙන් ශක්තිය ලබා ගෙන ඒ තුළින් ඉදිරියට යාමටයි.

අපගෙන් සමහරුන්ට දෙවියන්වහන්සේ දැනටමත් කථා කරමින්, උන්වහන්සේගේ බලය ලබා ගැනීමත්, ධෛර්‍යයමත් වීමටත් හා සමාව ලබා ගනිමින් ස්වාමීන්වහන්සේ තුල ගොඩනැගෙන්න උන්වහන්සේ වෙතට එන්න කියා පවසයි. දාවිත් දෙවියන්වහන්සේගේ දැතට භාර වීම ප්‍රමාධ වූයේ නැත. අපිද ප්‍රමාධ නොවී දෙවියන්වහන්සේ වෙතට ලංවෙමු.

මෙලෙස දාවිත් දෙවියන්වහන්සේ වෙතට හැරුන විටදී කිසිම දෙයක් අඩු නොමැතිව සියලුම දේ ඔහු ලබාගත්තේය කියා දේව වචනය අපට පවසයි. ***''....ඔවුන් ගත්තාවූ කිසිවක්වත් අඩු නැතුව දාවිත් සියල්ලම නැවත ගෙනාවේය.''*** *(1 සාමුවෙල් 30:19)* ඔහුගේ පවුල, මුදල්, ජනප්‍රියකම, මිත්‍රයින්, ඔහු සතුව තිබූ සෑම දේම හා සියලු වස්තුව ආදී සියල්ලම ඔහු නැවත ලබාගත්තේය. ඔහු සතුරාගේ අතින් සියලුම දේ බේරාගත්තේය. අප දෙවියන්වහන්සේව සොයමින් උන්වහන්සේව විශ්වාස කරන විටදී උන්වහන්සේ ස්වර්ගයේ දොරවල් විවෘත කරමින් අපිට අහිමි වූ සෑම දේම නැවත හිමිකර ගැනීමට කරුණාව දෙන සේක.

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call

**YouTube**

**Please subscribe**

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks.

**- Editor**

ඔබවත්, ඔබ, දාවිත් සිටිය ස්ථානයේහි තබා බලන්න. මට තිබූ සෑම දෙයක්ම මට අහිමි වී ඇත. දැන් මා තනිවී සිටිමි කියා සිතමින්, ''මට මාර්ගයක් තිබේද? මේ දේවල් නිසා මා තනිවී සිටිමි'' කියමින් ඔබ පසුතැවෙනවා ඇත.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, අපි තනිවී නොමැති බව මතක තබා ගන්න. ඔබගේ පියා වෙතට යන්න. ඔහු සෑම දේම අපගේ යහපත උදෙසා කරයි.

ප්‍රිය මිත්‍රය, දාවිත්ගේ වැටීමට හේතු කාරණාව වූයේ ඔහුගේ සිතුවිල්ලයි. එනිසා අප සිතන්නාවූ සිතුවිලි මොනාද කියා ප්‍රවේසම් විය යුතුයි. සෑම මොහොතකම අපගේ දෙවියන්වහන්සේ කරුණාවන්ත පියෙක් ලෙස සිටින බව මතක තබා ගන්න. ඔබ සහ මා නැවත හැරී උන්වහන්සේ වෙතට එනතුරු උන්වහන්සේගේ සදාකාලික දෑත් දිගු කරමින් බලා සිටී.

ඔබ උන්වහන්සේ වෙතට දුවමින් පැමිණෙනවාද?

*******

## ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 3rd OCTOBER 2024.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**